

# ළමයින්ගේ ලෝකය සුරැකීම



**විජේරත්න පතිරාජ**
බාහිර කථිකාචාර්ය -
ශ්‍රී පාලි මණ්ඩපය
කොළඹ විශ්ව විද්‍යාලය

2017 වසර තුල ඔස්ට්‍රේලියා පරිසරයෙහි මා ගතකළ තුළදී මෙරට ජීවත් වන සිංහල සංක්‍රමික පිරිස් අතර දෝලනය වන ගැටලු පිළිබඳව මට හැඟුණු අදහස් සමුදායක් ලිපි දහයක් පමණ ඔස්සේ පල කිරීමට "සන්නස" ප්‍රජා පුවත් පත ලබා දුන් වරම ගැන කෘතවේදීත්වය පළකරනු කැමැත්තෙමි. එහිදී පළ කළ අවසාන ලිපිය වූයේ 2017 සැප්තැම්බර් කලාපයේ පළවූ " ළමයින්ගේ ලෝකය සොයා යෑම" යන්නයි. සැප්තැම්බර්වල සිට මාස කිහිපයක් මව් බිමෙහි ගත කර නොබෝදා නැවත ඔබ හමුවට පැමිණි මට නැවත ඔබ ඇමතීමට ආරාධනයක් ලැබීම ගැන සන්නස සහාය සංස්කාරක අශෝක සිල්වා සහෘදයාට ස්තූතිවන්ත වෙමි.

මාගේ ලිපි පෙළ කියවීමේ උතුම් අධ්‍යාෂය වූයේ ශ්‍රී ලාංකික සහෝදර ජනතාව මේ මහද්වීපයට සංක්‍රමණය වී ගොඩ නගන සිංහල බෞද්ධ සංස්කෘතිය පවත්වාගෙන යාමේදී වැඩිහිටි අය සතුවිය යුතු වගකීම් හා යුතුකම් පිළිබඳ කිසියම් ආවර්ජනයකට අපගේ අවධානය යොමු කිරීමේ උදාර පරමාර්තයයි. එහිදී අප උපන් භූමිය, හැදුනු වැඩුණු දේශය හා සංස්කෘතිය, අපගේ වැඩිහිටියන් හා පාරම්පරික උරුමයන් සියල්ල හැරපියා මෙහි ස්ථිර පදිංචි කරුවන් හැටියට හැඩගැසීම අපගේ ජීවිතවලට බලපාන මාහැඟි සංක්‍රාන්තියක් බව අමුතුවෙන් කිවයුත්තක් නොවේ. එය වූ කලී කිසියම් ආකාරයක් නව සංස්කෘතික පුනරුප්පත්තියකි. එම නව මහද්වීපික සාගර දළ රළ අතර, බොහෝ විට අප උපතින් උරුම කරගත් ජාතික අනන්‍යතාවන්, සිතුම් පැතුම්, ආකල්ප ආදී විවිධ මානුෂීය හැඟීම් සමුදායක් පවා අප අතරින් මැකී යන්නක් විය හැකිය. මන්ද යත් අප කාටත් අනිවාර්යයෙන්ම නොපමාව ඔස්ට්‍රේලියානු සංස්කෘතික දම්වැලෙහි පුරුකක් ලෙසට අනුගත වීම නොවැලැක්විය කරුණක් වන බැවිනි.

කිසියම් උප සංස්කෘතියක්, මහ සංස්කෘතියක් සමඟ මුසුවීමේදී කාලයක් ඇවෑමෙන් දුර්වලයා බලවතාගේ ගොදුරක් බවට පත්වීම සිද්ධාන්තයක් ලෙස පිළිගත් කරුණකි. එහෙත් එය වලක්වා සුරක්ෂිත කර ගතයුතු ධර්මයකි. මෙම ප්‍රවාහයේ සිංහල සංක්‍රමණි කයන් වන අප මුහුණදෙන ගැටළු සමඟ ගලපා සිතා බැලීම මෙහිදී වැදගත්ය. මව්බිම සමඟ ඇති සියළු සම්බන්ධතා හැරපියා සංක්‍රමණිකයන් ලෙස පැමිණ දහසක් දුක් පීඩා විඳ වැඩිහිටියන් ලබා ගන්නා සංතෘෂ්ටිය කවරේද ? එය බොහෝ විට අපට මව්බිමෙන් පහසුවෙන් ලබාගත නොහැකි රැකියා, යාන වාහන නිවාස වැනි භෞතික භාණ්ඩ වට්ටෝරුවක් සඳහා කළ අභිනිශ්ක්‍රමණයක් නොවන්නේද ? එය අපට දැනෙන්නේ දරුවන්ගේ ලෝකයෙහි අනාගතය පිළිබඳ ඇතිවන අවිනිශ්චිතතාවක් හමුවේදීය. අප මෙහිදි දිනාගන්නා භෞතික සම්පත් ලෝකය තුළ දරුවන් ඉතා අසරණ ක්ෂුද්‍ර ප්‍රාණීන් බවට පත්වන්නේ ඔවුන්ගේ අනාගත ලෝකය අප විසින් නොසලකා හැරීමෙන්ය. කෙටියෙන් සඳහන් කළහොත් දැනට ජීවත් වන වැඩිහිටි පරම්පරා වලින් පසු ඉතිරිවන අපගේ දරුවන්ගේ ඉරණම, ජාතියක් ලෙස කෙසේ ගොඩනැගේවිද යන්න විවිධ දෘෂ්ඨිකෝණ වලින් විමසා බැලීම අපගේ යුතුකම නොවන්නේද ?

ඕස්ට්‍රේලියාවේ ආදිවාසීන්ට අද මුහුණපෑමට සිදුවී තියෙන බේදවාචකය පිළිබඳව පසුගියදා පළ වූ වාර්තාව සිංහල සංක්‍රමණිකයන්ට පමණක් නොව, අනෙක් සියළුම සංක්‍රමනකයන්ට ද රතු එලියක් දල්වන්නකි. ඕස්ට්‍රේලියානු ජාතික දිනය ලෙස ජනවාරි 26 දා පිළිගෙන ප්‍රකාශයට පත්ව, එය සමරනු ලැබුවත්, ආදිවාසීන් විසින් එය පසුගිය වසර 80ක සිට ප්‍රතික්ෂේප කර ඇති බවත් එම දිනය ඔවුන්ගේ රට ඉංග්‍රීසින්ගේ ආක්‍රමණයට ලක් වූ දිනය ලෙස සැලකීමත් එම වාර්තාවයි. ඊට හේතුව ඕස්ට්‍රේලියානු ඉතිහාසයේ ඉංග්‍රීසි ආධිපත්‍යය, පැතිර වූ 1796 සිට මෙම ආදිවාසීන්ගේ සංස්කෘතිය යටපත් කරගෙන, යටත් විජිත සංස්කෘතිය හමුවේ ඔවුන්ව තම නිජබිම්වලින් එලවා දමා සිරකඳවුරුවලට දැක්කූ බවය. ආදිවාසීන්ගේ දුක් ගැනවිල්ල වන්නේ සිරගත කළ යුත්තේ ආක්‍රමණිකයන් හා සිරකරුවන් ලෙස මෙරටට පැමිණි ඉංග්‍රීසි ජාතිකයන් බවය. ආදි වාසීන් ජන්ම භූමියක් නොමැති ඉබාගාතේ යන කාලකන්නි පිරිසක් ලෙසට හන්වඩු ගසා තිබූ මෙම බේදවාචකය විසඳී ඇත්තේ 1992 දී ශ්‍රේෂ්ඨාධිකරණයට ඉදිරිපත් කරනු ලැබූ යුක්තිය ඉටුකර ගැනීමේ ප්‍රභල අබියාචනයක ප්‍රතිඵලයක් ලෙසිනි. මේ කළු මිනිසුන්ටද මේ භූමියේ අයිතියක් ඇති බවට උසාවි තීන්දුව මගින් ඕස්ට්‍රේලියා මහාද්වීපය යුරෝපීය සුදු මිනිසුන් පමණක්ම නොවන බව නීතිය ඉදිරියේ පිළිගෙන ඇත. එය මේ රට බහු සංස්කෘතික රටක් ලෙස ව්‍යාප්ත වීමට බල පෑ ඓතිහාසික තීන්දුවක් බව පෙනී යයි.

ආදිවාසීන්ට පත් වූ මෙ ඉරණම මෙරට සංක්‍රමණිකයන්ට බොහෝ පාඩම් කියාදෙන්නක් ලෙස හැඟී යයි. ඕස්ට්‍රේලියානු සිංහල ජනතාව හා ඔවුන්ගේ දරුවන් පිළිබඳව සිංහ හඬක් නැංවූ ප්‍රවීන ලේඛක ඩී.බී. කුරුප්පු වියතානන් සන්නස පුවත්පතට සැපයූ අවසන් ලිපිය වන " නොනවතින අරගලය හා නොවිසඳෙන ගැටළු" නම් සිරසින් යුක්ත වූ රචනය අපව අවදි කරවන්නකි. අධිරාජ්‍යවාදී ඉතිහාස විසින් නොසලකනු ලැබූ මානව අයිතිවාසිකමත් යුක්තිය හා නීතිය හමුවේ සාධාරණත්වයට පත්කර ගැනීමේදී තම වර්ගයාගේ සංස්කෘතික උරුමයන් රැකගැනීම සඳහා ආදී වාසි නායකයන් දක්වා ඇති නොසැලකිල්ලේ ඉරණම අප ඉදිරියේ ඇති අවධානම් ගැටළු පිළිබඳව අපට ආවර්ජනය කර දෙයි. ඩී. බී. වියතාණන් මෙම ලිපිය නිමකරන්නේ "ආදිවාසී ජනතාව ඔවුන්ගේ දූ දරුවෝ අදත් පරණ තැනටම වැටී පරණ පුරුදු මත් ද්‍රව්‍ය පරිහරණය කරමින් නිවාස පහසුකම්, දරුවන්ගේ අධ්‍යාපනය, සිරකූඩුවේ ලැග සිටීම, ළමා අපචාර වැනි සකල විද ගැටළු වලට මුහුණ දෙමින් පරණ පුරුදු සිංදුවම ගායනා කරන්නෝය" යනුවෙනි. එයින් ප්‍රකාශ වන්නේ ආදිවාසීන්ගේ කිසිම සංස්කෘතික ගැටළුවක් අදටත් විසඳී නොමැති බවය. ඕස්ට්‍රේලියාවේ මුතුන් මිත්තන්ට මෙවැනි ඉරණමක් උදා වූයේ කවර හේතු නිසාදැයි විමසා බැලීමේදී මතුවන හේතු කාරණා පිළිබඳව අවධානය යොමුකිරීම වැදගත්ය. කිසියම් ජාතියක් විශ්ව භූතලය මත කවර හෝ පරිසරයක ජීවත් වන්නේ නම් තමන්ට එහි ඇති ඓතිහාසික අයිතිය හා වටිනාකම් ස්ථාපිත වන සේ තම අනන්‍යතාව ස්ථාවර කරගතයුතු වීමේ වටිනාකම මෙයින් අපට මතක් කර දෙයි. මෙහිදී ආදීවාසීන්ට තිබූ තම ආවේනික මව්බස, ඇදහිලි විශ්වාස ක්‍රම, කලා සම්ප්‍රදායන්, සිරිත් විරිත්, ආකල්ප ආදිය ජාතික වශයෙන් ස්තාපිත කර නොගැනීම. ඔවුන්ගේ සංස්කෘතික උරුමයන් මුල් ඕස්ට්‍රේලියානු පොළව මත මුල් බැස නොගැනීමට හේතුවන්නට ඇතැයි පෙනී යයි. ඔහෙයින් පසුකාලීනව හමාගෙන පැමිණි යටත් විජිත ප්‍රවාහය හරහා ඔවුන්ගේ සංසකෘතිය සෝදා පාලුවට ලක්වීම පුදුමයක් නොවේ. ඒ ඕස්ට්‍රේලියානු ඉංග්‍රීසි පාලනයේ දුර්වලකමකට වඩා ඊට මුහුණ දුන් ආදි වාසීන් ඔවුන්ගේ අනාගත පරපුරට තම ඓතිහාසික උරුමයන් පවරා නොදීමේ විපාකයක් ලෙස හැඳින්විය හැකිය. මෙවැනි බහු සංස්කෘතික ලක්‍ෂණ ඇති රටක ජීවත් වන සංක්‍රමණීක පිරිසක් වන අපගේ සංස්කෘතික උරුමයන් ආරක්ෂා කරගැනීමේ හා පවත්වාගෙන යාමේ වටිනාකම මෙන්ම අභියෝග පිළිබඳව මෙහිදී අපට ඉඟියක් මතුකර දක්වයි.

කුඩා දූපතකට අයත්, එහෙත් සම්භාවනීය ඉතිහාසයක බසකට, සාහිත්‍යයකට, දාර්ශනික ට ආගමකට ද අයත් ජාතියක් ලෙස සිංහලයන් වසරින් වසර වෙනත් රටවල සංක්‍රමිකයන් ලෙසට පත්වීමට පෙළඹී සිටීම ඉමක් නොදකින ජාතියක ගැටළුවකි. ශ්‍රී ලංකාව දේශපාලකයින් විසින් ඉතා කෙටිකාලයක් තුල දේශපාලනික හා සාමාජික වශයෙන් පත් කළ මේ ජරා ජීර්ණ පාලන තත්ත්‍රයට සියළු පාලකයින් වගකිව යුත්තකි. ඕස්ට්‍රේලියාවේ පමණක් ස්ථිරව ලක්‍ෂ දෙකක් ඉක්මවා ගිය සිංහල සංක්‍රමික පිරිසක් සිටින අතර, මෙහි උපත ලද ඕස්ට්‍රේලියානු සිංහල දූ